# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)

**වල්පොල පියානන්ද අධ්‍යාපන හා සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජානක බණ්ඩාර මහතා විසින් 2013 අගෝස්තු මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 අගෝස්තු මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[264 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)

**වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

“වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී මහා විහාර පාර, පාමංකඩ, දෙහිවල යන ලිපිනයෙහි පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක      දරන වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” කිරීම යනුවෙන් හඳුන්වනු ලබන) වල්පොල පියානන්ද අධ්‍යාපන හා සංස්කෘතික පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2—PL 007466 -75 (2013/07)

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) සංඝයා වහන්සේලා බුද්ධ ශාසන වැඩ සඳහා විදේශ රටවල සංචාරය කිරීමට පෙර ඔවුන් වඩාත් සූදානම් වීම සඳහාත්, සංස්කෘතික ගැටීම් වැළැක්වීම සඳහාත්, අනෙකුත් රටවල අධ්‍යාපනික හා සංස්කෘතික දැනීම ප්‍රවර්ධනය කිරීම;

(ආ) අනෙකුත් රටවල සංස්කෘතීන්, චාරිත්‍ර වාරිත්‍ර සහ භාෂාවන් අධ්‍යයනය කිරීමේ දී සංඝයා වහන්සේලාට සහාය වීම;

(ඇ) ශිෂ්‍යත්ව, ප්‍රදාන සහ තෑගි පිහිටුවා ඒවා සුදුසු ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට ලබා දීම හා ඔවුන්ගේ අධ්‍යාත්මික, දාර්ශනික, සංස්කෘතික, විද්‍යාත්මක හා කාර්මික අධ්‍යාපනය සඳහා සහාය වීම ;

(ඈ) ශ්‍රී ලාංකිකයන්ට හා ඇමෙරිකානුවන්ට ඔවුන්ගේ එක් එක් සංස්කෘතීන්, භාෂාවන් හා වෙනත් භාෂාවන් හැදෑරීම සඳහා සහාය වීම, අධ්‍යාපනික සංචාර සංවිධානය කිරීම, එම සංචාර සඳහා සහභාගී වන්නන්ට නේවාසිකාගාර පහසුකම් සැලසීම හා අධ්‍යාපනික හා සංස්කෘතික නියෝජිතයන් හුවමාරු කර ගැනීම ;

(ඉ) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යෑම, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය හා වැඩිදියුණුව සඳහා හිතකර යයි අදහස් කරනු ලබන පොත්, ප්‍රවෘත්ති පත්‍ර, වාර සඟරා හා අනෙකුත් ප්‍රකාශන මිල දී ගැනීම, ඒවාට දායක වීම හා ප්‍රකාශයට පත් කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සමිති හා සංවිධාන සමග සම්බන්ධ වී සහයෝගයෙන් කටයුතු කිරීම ;

(උ) සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංගම්, සමිති හා සංවිධානවල සහයෝගයෙන් අවශ්‍යතා ඇති අයට ඇස් කණ්ණාඩි ලබා දීමට සහාය වීම හා ප්‍රවර්ධනය කිරීම ;

සංස්ථාවේ කටයුතු කළමණාකරනය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සංස්ථාව් තත්කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන එකොළොස් දෙනකුට නොඅඩු වෙනත් සාමාජිකන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකාර කමිටුවක් විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ සාමාජිකයා වන ගරු වල්පොල පියානන්ද හිමි අධ්‍යක්ෂ ජනරාල් විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල් ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවාව වූ ද, මෙහි උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද, තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හො නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය :—

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ;

(ඉ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම්කිසි රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම, හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් සහ සංස්ථාවට අය විය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පැවැති පදනම විසින් ගෙවිය යුතු තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන පදනම විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු ව තිබූ සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල්, ප්‍රදාන සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා පදනමට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) පදනමට එහිම අරමුදලක් තිබිය යුතු අතර, පදනම සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල් ගාස්තු හෝ ප්‍රදාන පදනම විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ සංස්ථාව සතු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී පදනම විසින් වියදම් කරන ලද සියලුම මුදල් භාර අරමුදලින් ගෙවිය යුතු ය.

පදනම විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ පදනම වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපල පදනම විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද, පදනමේ තත්කාලයේ බලපවත්නා

රීතිවලට යටත්ව එකී දේපල විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද පදනම සතු වන්නේ ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

පදනම විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

**11.** පදනම විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල පදනමේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, පදනමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හො දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** (1) පදනමට ලැබුණු සහ පදනම විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට පදනම විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) පදනමේ ගිණුම්, සෑම වර්ෂයක ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට, විගණනය කරනු ලැබිය යුතු අතර, පදනම විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයෙක් හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

පදනමේ මුද්‍රාව.

**13.** පදනමේ මුද්‍රාව පදනමේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තවද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින් ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.